NALANDA VIDYALAYA COLOMBO 10

නාලන්දා විද්‍යාලය - කොළඹ 10

ඒකක පරීක්ෂණය

NALANDA VIDYALAYA COLOMBO 10

09 ශ්‍රේණිය	විද්‍යාව	ඒකකය 19: ස්වාභාවික සම්පත් තිරසරව භාවිතය

I කොටස

- **නිවැරදි පිළිතුර යටින් ඉරක් අඳින්න.**

01. පහත ද්‍රව්‍යවලින් ඛනිජයක් නොවන්නේ,

(1). සර්කෝන් (2). රූටයිල් (3). ඇපටයිට් (4). නයිස්

02. දෘඪි බවින් වැඩිම හා අඩුම ඛනිජය වන්නේ,

(1). දියමන්ති - මිනිරන් ය
(3). ටැල්ක් - දියමන්ති ය
(2). දියමන්ති - ටැල්ක් ය
(4). මිනිරන් - ටැල්ක් ය

03. බළලෙකුගේ ඇස ලෙස දිස්වන මැණික් වර්ගය,

(1). නීල මාණික්‍යය (2). වෛරෝඩි ය (3). පසිංගල් ය (4). මරකත ය

04. වැසි ජලය සංරක්ෂණය කර ගැනීමට සකස් කළ නිර්මාණයකි.

(1). ඇළ (2). ගංගා (3). වැව (4). පොකුණ

05. මැණික් කපා ඔප දැමූ විට දිලිසීම වැඩිවන්නේ එහි .... ඉතා ඉහළ බැවිනි.

(1). වර්තනාංකය (2). දෘඪි බව (3). මෘදු බව (4). වයනය

06. ශාක වැස්ම නිසා සිදුවිය හැකි උපද්‍රව අවම කර ගත නොහැක්කේ කුමන ස්වාභාවික විපතද?

(1). නායයාම (2). සුනාමි (3). අකුණු (4). ගංවතුර

07. ද්‍රව සතු සුවිශේෂ ලක්ෂණයක් නොවන්නේ,

(1). කල්පැවැත්ම
(3). වයිරම් තිබීම හා වර්ණවත් වීම
(2). තාපය හා විදුලියට ඔරොත්තුදීම
(4). තාප හා විද්‍යුත් සන්නායක වීම

08. තිරසර භාවිතය සම්බන්ධව නිවැරදි අදහස් දක්වා ඇති පිළිතුර වන්නේ,

(1). වර්තමානයේ භාවිතා නොකරමින් රැක ගැනීම
(2). වර්තමානයේ භාවිතා කරන අතර අනාගත පරපුරට ඉතිරිකර දීම
(3). ඉතා ඕනෑකමින් පරිස්සම් කිරීම
(4). අන් අයගේ පරිහරණය සඳහා ලබා දීම

09. ජලය තුළදී කල්පවතින ද්‍රවයකි,

(1). හොර (2). රුක්අත්තන (3). අඹ (4). කුඹුක්

10. ශ්‍රී ලංකාවේ ඇපටයිට් නම් ඛනිජය බහුලව ඇති ප්‍රදේශය වන්නේ,

(1). කැකිරාව (2). එප්පාවල (3). මාන්කුලම (4). පුල්මුඩෙයි

11. දැවවලට හානි සිදුවන්නේ,

(1). බැක්ටීරියා හා දිලීර මගිනි
(2). දිලීර හා කෘමීන් මගිනි
(3). වේයන් හා ගුල්ලන් මගිනි
(4). බැක්ටීරියා, වෛරස හා කෘමීන් මගිනි

12. බෝරෝන් ප්‍රතිකර්මය යෙදීමෙන් කල්තබා ගන්නා දැව වර්ගය වන්නේ,

(1). රබර් හා පයිනස් දැව
(2). කොස් හා කොහොඹ දැව
(3). කළුවර හා නැදුන් දැව
(4). අඹ හා ලුණුමිදෙල්ල දැව

13. යාන්ත්‍රික අත් ඔරලෝසු සඳහා මැණික් යොදා ඇත්තේ,

(1). වටිනාකම වැඩිවීමට
(2). අලංකාරයට
(3). විවිධ වර්ණවලින් ලබාගත හැකි නිසා
(4). ගෙවීයාම අඩු නිසා

14. පහත සඳහන් දැව වලින් කල් පවතින ගුණය අඩු දැව වර්ගය කුමක්ද?

(1). කොස්　(2). කළුවර　(3). නැදුන්　(4). අඹ

15. නිල් මැණික්, දියමන්ති, වීදුරු, ජලය යන ඒවා වර්තනාංකයේ ආරෝහණ පිළිවෙලට නිවැරදිව දක්වා ඇත්තේ,

(1). නිල් මැණික්, දියමන්ති, ජලය, වීදුරු
(2). ජලය, වීදුරු, නිල් මැණික්, දියමන්ති
(3). වීදුරු, ජලය, නිල් මැණික්, දියමන්ති
(4). දියමන්ති, නිල් මැණික්, වීදුරු, ජලය

II කොටස

01. ශ්‍රී ලංකාවේ මැණික් කර්මාන්තය අවුරුදු 2500 කටත් වඩා පැරණිය. ශ්‍රී ලංකාවේ මැණික් වර්ග 70 පමණ ඇත.

i. මැණික් යනු පාෂාණ වර්ගයක්ද ඛනිජ වර්ගයක්ද?
ii. ශ්‍රී ලංකාවේ හමුවන මැණික් වර්ග 2ක් ලියන්න.
iii. මැණික්වල වැදගත් ලාක්ෂණික ගුණ 2ක් ලියන්න.
iv. ඛන්ජවල දැඩි බව පරීක්ෂාකිරීමට සකස් කර ඇති පරිමාණය කුමක්ද?
v. නියපොත්තෙන් සීරීමට හැකි ඛනිජ වර්ග 2ක් නම් කරන්න.
vi. මැණික්වලට වර්ණය ලැබී ඇත්තේ කෙසේද?
vii. මැණික් කර්මාන්තය ආශ්‍රිත පාරිසරික ගැටලු 2ක් ලියන්න.

02. ශ්‍රී ලංකාව යනු විවිධ ස්වාභාවික සම්පත්වලින් පෝෂිත රටකි.

i. ස්වාභාවික සම්පත් යනු මොනවාද?
ii. ස්වාභාවික සම්පත්වල තිරසාර භාවිතය යනු කුමක්ද?
iii. මූලික ස්වාභාවික සම්පත් 4ක් නම් කරන්න.
iv. ඛන්ජවලට උදාහරණ 2ක් ලියන්න.
v. ඛන්ජයක් පාෂාණයකින් වෙන්කර ගන්නා ලක්ෂණ 2ක් ලියන්න.
vi. පාෂාණවලට උදාහරණ 2ක් ලියන්න.

03. ස්වාභාවිකව ප්‍රතිචක්‍රීකරණය වන එමෙන්ම පුනර්ජනනීය වන එකම ගොඩනැගිලි ද්‍රව්‍ය වන්නේ දැවය.

i. දැව සතු විශේෂ ලක්ෂණ 2ක් ලියන්න.

ii. අතීතයේදී විශාල වශයෙන් භාවිතා කළ වියළි කලාපයේ බහුලව තිබූ දැව වර්ග 2ක් නම් කරන්න.

iii. දැව වර්ගවල විශේෂිත භාවිත අවස්ථා 2ක් නම් කරන්න.

iv. දැව දිරාපත් වන්නේ ඇයි?

v. දැව අභ්‍යන්තරයේ ඇති දිලීර වර්ධනයට හිතකර තත්ත්ව මොනවාද?

vi. සාමාන්‍යයෙන් ගසක වැඩි කාලයක් පවතින්නේ කුමන කොටසද?

vii. දැව දිරාපත්වීම වැළැක්වීමේ ප්‍රධාන ක්‍රම 2ක් ලියන්න.

viii. දැව පදම් කරන්නේ කෙසේද?

04. හිස්තැන් සඳහා සුදුසු වචනය වරහන් තුළින් තෝරා ලියන්න.

(වර්තනාංකය, අරටුව, හොර, ජලය, අමුද්‍රව්‍ය, දූෂණය, කොස්,
වැව, ස්වාභාවික සම්පත්, තිරසර භාවිතය)

i. සොබාදහමෙන් අපට ලැබෙන ප්‍රයෝජනවත් ද්‍රව්‍ය .... ලෙස හැඳින්වේ.

ii. ස්වාභාවික සම්පත් අනාගත පරපුරට භාවිත කිරීමට අවස්ථාව සලසා දීම ස්වාභාවික සම්පත් .... ලෙස හැඳින්වේ.

iii. වෙනත් ග්‍රහ ලෝකවල ජීවීන් සිටීදැයි සෙවීම සඳහා බලන්නේ එහි .... පවතීද යන්නයි.

iv. අතීතයේදී ජල සංරක්ෂණය හා තිරසර භාවිතය සඳහා කරනු ලැබූ ශ්‍රේෂ්ඨ නිර්මාණයක් ලෙස .... හැඳින්විය හැක.

v. ශ්‍රී ලංකාවේ බොහොමයක් ඛනිජ අපනයනය කරන්නේ .... හැටියට මිස ඒවායේ නිෂ්පාදන ලෙස නොවේ.

vi. මැණික්වල .... ඉහළ බැවින්, කපා ඔප දැමූ මැණික් තුළට ආලෝකය ඇතුල් වූ පසු දිස්නයක් ලබා දේ.

vii. දැව භාණ්ඩ නිෂ්පාදනය සඳහා .... භාවිත කිරීම දැව දිරාපත් වීම අවම කරයි.

viii. ජලය තුළදී කල්පවතින නිසා දැව යට කෙරෙන යෙදවුම් සඳහා .... දැවය භාවිත කරයි.

ix. ශක්තිය, කල්පැවැත්ම හා ඔපය නිසා නිවසක ඉදිරිපස දොර සඳහා .... දැවය භාවිත කරයි.

x. මැණික් ගැරීම නිසා ස්වාභාවික ජලාශ, ගංගා ආදියේ ඇති ජලය .... වේ.